රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

அரசாங்க நிருவாகச் சுற்றறிக்கை

**Public Administration Circular**

අංක<br>இல.<br>No. } 36

# රාජ්‍ය අංශයේ සංස්ථාවල හා වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය සඳහා රජයේ සේවකයින් මුදා හැරීම

# அரசாங்கத் துறை யாக்கங்களிலும் ஏனைய நியதிச்சட்டமுறையான சபைகளிலும் சேவையாற்றுவதற்காக அரசாங்க சேவையாளரை விடுவித்தல்

# Release of Public Servants for Service in Public Sector Corporations and other Statutory Boards

ආයතන මාලා අංක<br>தாபனத் தொடர் இல.<br>Establishments Series No. } 28

---

රජයේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

මිළ/விலை/Price : -/10 තැපැල් ගාස්තුව/தபாற் செலவு/Postage : -/10

## රාජ්‍ය අංශයේ සංස්ථාවල හා වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය සඳහා රජයේ සේවකයින් මුදා හැරීම

රාජ්‍ය අංශයේ සංස්ථාවල හා වෙනත් ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය සඳහා රජයේ සේවකයින් මුදා හැරීමේ කොන්දේසි පිළිබඳ ඇතැම් වෙනස්කම් ඇති කළ 1971 මැයි 25 වැනි දිනැති අංක 31 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සම්බන්ධයෙනි. එම චක්‍රලේඛයේ පහත සඳහන් විධිවිධානයන්ට ඔබේ අවධානය විශේෂයෙන් යොමු කරවනු කැමැත්තෙමි.

(අ) අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා සංස්ථාවකට/මණ්ඩලයකට තාවකාලිකව මුදා හරින ලද රජයේ සේවකයෙකු රජයේ සේවයට ආපසු යාමට හෝ, සංස්ථාවේ/මණ්ඩලයේ ස්ථිර සේවය සඳහා, (ආපසු යාමේ අයිතිය රහිතව) රජයේ සේවයෙන් මුදා හරිනු ලැබීමට හෝ මනාපය පළ කළ යුතුය. මේ මනාපය තාවකාලික මුදා හැරීමේ කාලය අවසන් වීමට පෙර පළ කළ යුතුය ;

(ආ) සංස්ථාවක/මණ්ඩලයක සේවය කරන්නා වූ ද, තාවකාලික මුදා හැරීම පිට දැනටත් අවුරුදු දෙකක් සම්පූර්ණ කර ඇත්තා වූ ද, රජයේ සේවකයෙකු විසින් 1971 ජුලි 25 දිනට පෙර මේ මනාපය පළ කළ යුතුය. එබඳු රජයේ සේවකයෙකු සංස්ථාවක/මණ්ඩලයක සේවයට ස්ථිරව බැඳීමට මනාපය පළ නොකරතොත්, හෝ ඔහුගේ සේවය එම සංස්ථාවට/මණ්ඩලයට ස්ථිරව අවශ්‍ය නොවෙතොත්, හෝ ඔහු මෙකී දිනයේ දී රජයේ සේවයට ආපසු යා යුතුය.

2. දැනටත් මුදා හරිනු ලැබ සිටින හා මින් ඉදිරියට සංස්ථාවන්ට/මණ්ඩලයන්ට මුදා හරිනු ලැබිය හැකි සියලු රජයේ සේවකයින් විසින් මේ විධිවිධාන පිළිපදිනු ලබන බව සහතික කරනු සඳහා ඔබ වහාම අවශ්‍ය කටයුතු කළ යුතුය.

බී. මහාදේව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1971 ජුලි මස 9 වැනි දින.
අංක : 2/3/9 (එච්) III

ඉක් 4935—9,760 (71/7)